සේවකයන්ගේ මූර්ත වැටුප් 1980 දී සියයට 12 කින් අඩු වූ අතර, 1979 වසරේ සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කළ රජයේ පාසල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප් සියයට 14 කින් පහත වැටිණි.

1980 වර්ෂය තුළ දී පුද්ගලික අංශයේ කෘෂිකාර්මික සේවකයන්ගේ මූල්‍ය වැටුප් සියයට 25 කින් වැඩි වූ අතර කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප් සියයට 22 කින් වර්ධනය විය. 1979 සඳහා වූ සංසන්දිත සංඛ්‍යා වනුයේ පිළිවෙළින් සියයට 28 සහ සියයට 17 කි. මේ අතර පසුගිය වසරේ දී සියයට 27 කින් වැඩි වූ පුද්ගලික අංශයේ සේවකයන් සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය වැටුප් දර්ශකය මෙම වසරේ දී සියයට 25 කින් වැඩිවිය.

එහෙත් 1979 වර්ෂයේ දී සියයට 15 කින් වැඩි වූ කෘෂිකාර්මික සේවකයන්ගේ මූර්ත වැටුප් 1980 වර්ෂයේ දී සියයට 0·2 ක අඩුවීමක් පෙන්විය. එමෙන්ම 1979 වර්ෂයේ දී සියයට 5 කින් වැඩි වූ කර්මාන්ත හා වාණිජ අංශයන් හි සේවකයන්ගේ මූර්ත වැටුප් 1980 වර්ෂයේ දී සියයට 3 කින් පහත වැටිණි.

## විදේශීය වෙළෙඳාම

ශ්‍රී ලංකාවේ වෙළෙඳ තුලනය (රේගු සංඛ්‍යා අනුව), 1980 දී රුපියල් දශ ලක්ෂ 16,364 (විගැහි දශලක්ෂ 761) ක හිඟයක් පෙන්නුම් කළ අතර, මෙය 1979 වෙළෙඳ තුලනය වූ රුපියල් දශලක්ෂ 7,287 (විගැහි දශලක්ෂ 362) සමග සැසඳූ කල සියයට 125 (විගැහි වටිනාකම් අනුව සියයට 110) ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. 1980 වර්ෂයේ අවාසිදායක වෙළෙඳ තත්ත්වයට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ, ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 33,637 (විගැහි දශ ලක්ෂ 1,563) දක්වා රුපියල් දශ ලක්ෂ 11,077 කින් හෙවත් සියයට 49 (විගැහි අනුව සියයට 39) කින් තියුණු ලෙස වැඩිවීමය. මීට ප්‍රතිවිරුද්ධ ලෙස අපනයන ඉපැයීම් සියයට 13 (විගැහි අනුව සියයට 6) කින් පමණක් වැඩිවී රුපියල් දශ ලක්ෂ 17,273 (විගැහි දශලක්ෂ 803) විය. කල්පමාවකින් පසුව වාර්තා කරන ලද ඇතැම් රාජ්‍ය ආයතනයන්හි ආනයන හා අපනයන සඳහා රේගු සංඛ්‍යා ගැලපූ කල්හි 1980 වර්ෂයේ වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 15,561 විය.

### 1 · 22 සංඛ්‍යා සටහන

### 1978—1980 වෙළෙඳ තුලනය

වටිනාකම රුපියල් දශ ලක්ෂ
(වරහන් තුල විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | ආනයන | | අපනයන | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා |
| 1978 | 14,687 (774)(අ) | 15,100 | 13,206 (674) | 13,193 | – 1,480 (–100) | – 1,907 |
| 1979 (ආ) | 22,560 (1,121) | 22,602 | 15,273 (759) | 15,282 | – 7,287 (–362) | – 7,320 |
| 1980 | 33,637 (1,563) | 33,360 | 17,273 (803) | 17,799 | –16.364 (–761) | –15,561 |

(අ) 1977 නොවැම්බර් 15 පසුව කරන ලද ගනුදෙනු සම්බන්ධව එදිනට පෙර පැවති අනුපාත අනුව විගැහි වටිනාකම ගලපන ලදී.

(ආ) සංශෝධිතයි.

මූලයයන්; ශ්‍රී ලංකා රේගුව;
ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව;
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව;
රාජ්‍ය මැණික් සංස්ථාව.

මුළු ආනයන වටිනාකම වැඩිවීමෙහි ලා බලපෑ ප්‍රධාන සාධකය වූයේ ආනයන මිළ දර්ශකය මගින් දක්වුනු පරිදි ආනයන මිළ සියයට 43 කින් වැඩි වීමයි. ආනයන පරිමාව සියයට 14 කින් වැඩිවීම මගින් මෙකී බලපෑම තියුණු කරවීය. පසුගිය වර්ෂය සමග සැසඳූ විට අපනයන පරිමා දර්ශකයෙන් මණින අපනයන පරිමාව සියයට 2 ක සුළු පහත වැටීමක් පෙන්නුම් කළ අතර අපනයන ඉපැයීම් වැඩිවීමට සම්පූර්ණයෙන් හේතුවූයේ අපනයන මිළ සියයට 16 කින් ඉහළ යාමය.

1979 වසරේ ප්‍රතිශත ඒකක 28 කින් වෙළෙඳ අනුපාතය පහත වැටීම සමග සසඳන කල්හි 1980 වර්ෂයේදී එය ප්‍රතිශත ඒකක 14 කින් පහත වැටිණ. වාර්තාගත වූ අවාසිදයක වෙළෙඳ තුලනය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයක් වූයේ වෙළෙඳ අනුපාත යෙහි මෙකී පහත වැටීමය. ආනයන මිළ සියයට 43 කින් ඉහළ ගිය අතර අපනයන මිල සියයට 16 කින් පමණක් ඉහළ යාම වෙළෙඳ අනුපාතය සියයට 19 කින් පහළ වැටීමට හේතු වූයේය. කලාපයෙහි අනිකුත් රටවල් සමග සසඳන කල්හි වඩාත්ම අහිතකර ලෙස බලපෑම් ලැබූ රට ශ්‍රී ලංකාව බව පෙනේ. ලැබී ඇති තොරතුරු අනුව පිලිපීනය සහ සිංගප්පූරුව වැනි රටවල වෙළෙඳ අනුපාත අහිතකර ලෙස හැසිරුණු බව පෙන්නුම් කළත් ඒ රටවල් කෙරෙහි වූ අහිතකර බලපෑම ශ්‍රී ලංකාවට දැණුන තරමින් එම රටවලට දැනුනේ නැත.

මෙම අහිතකර බලපෑම් දක්නට ලැබුණ ද, 1977 ප්‍රතිසංස්කරණයන් ගෙන් පසුව ආරම්භවුණු ආනයන සංයුතියෙහි ව්‍යුහයාත්මක වෙනස්කම් තවදුරටත් 1980 වර්ෂයේදීද දක්නට ලැබුණි. සංවර්ධන ජනිත භාණ්ඩ ගණයට අයත් ආයෝජන සහ අන්තර් භාණ්ඩයන්ගේ සාපේක්ෂ කොටස්, පාරිභෝගික භාණ්ඩවල සාපේක්ෂ කොටස අඩු කරමින්, වැඩිවිය. පාරිභෝගික භාණ්ඩ වල සාපේක්ෂ කොටස 1979 දී වූ සියයට 35 සිට 1980 දී සියයට 29 දක්වා අඩුවිය.

**1 · 23 සංඛ්‍යා සටහන**

**1971 - 1980 විදේශීය වෙළෙඳාම**

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංකය (1978=100) | | | | වෙළෙඳ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| | (අ) අපනයන නැ.වි.ස. | ආනයන මි.ර.ගැ. | වෙළෙඳ තුලනය | පරිමාව | | මිළ | | |
| | | | | සියලුම අපනයන | සියලුම ආනයන | සියලුම අපනයන | සියලුම ආනයන | |
| 1971 | 1,947 | 1,986 | − 39 | 104 | 68 | 17 | 17 | 98 |
| 1972 | 2,009 | 2,064 | − 55 | 102 | 67 | 17 | 18 | 94 |
| 1973 | 2,617 | 2,715 | − 98 | 103 | 60 | 20 | 24 | 82 |
| 1974 | 3,471 | 4,554 | − 1,082 | 89 | 42 | 31 | 42 | 72 |
| 1975 | 3,933 | 5,251 | − 1,318 | 107 | 52 | 29 | 49 | 58 |
| 1976 | 4,815 | 4,645 | + 170 | 102 | 57 | 34 | 44 | 78 |
| 1977 | 6,638 | 6,007 | + 631 | 94 | 73 | 55 | 54 | 102 |
| 1978 | 13,206 | 14,687 | − 1,480 | 100 | 100 | 100 | 100 | 100 |
| 1979 | 15,273 | 22,560 | − 7,287 | 101 | 123 | 109 | 152 | 72 |
| 1980 | 17,273 | 33,637 | − 16,364 | 99 | 140 | 126 | 217 | 58 |

(අ) ප්‍රති-අපනයන ඇතුලත්ය.

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව.

**අපනයන**

1980 වසරේ රුපියල් දශ ලක්ෂ 17,273 (විගැහි දශ ලක්ෂ 803) වූ අපනයන ඉපැයීම්, පසුගිය වසරට වඩා යසියට 13 ක වැඩිවීමක් වාර්තා කළේය. කෙසේ වුවද විගැහි වටිනාකම් අනුව එහි වර්ධන අනුපාතය සියයට 6 ක් පමණ විය. ආසන්න වශයෙන් මෙය පසුගිය වසරෙහි වර්ධන අනුපාතයෙන් සියයට 50 පමණි. රුපියල් වටිනාකම් අනුව පොල් මද නිෂ්පාදිත සහ මැණික් වල අපනයන ඉපැයීම් අඩු වූ අතර තේ, රබර්, සුළු කෘෂිකාර්මික භෝග සහ කාර්මික භාණ්ඩ අපනයන වලින් ලත් ඉපැයීම්

වැඩිවිය. කාර්මික භාණ්ඩ අපනයනයන්ට වඩා ප්‍රධාන අපනයන භෝගවල වර්ධන අනුපාතය පසුබැස්මක් දැක් වූ හෙයින්, 1979 සියයට 65 ක් වූ වැවිලි භෝග අංශය මුළු අපනයන වලින් හිමි කරගත් සාපේක්ෂ කොටස, 1980 වසරෙහිදී සියයට 58 දක්වා අඩු විය. අනෙක් අතට ඛණිජ තෙල් හිමි කරගත් කොටස, 1979 දී සියයට 13 ක සිට 1980 වසරෙහිදී සියයට 17 දක්වාද, රෙදිපිළි වල කොටස සියයට 7 සිට සියයට 11 දක්වාද වැඩි විය. සම්ප්‍රදයිකව, ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම විදේශ විනිමය උපයන්නා වූ රබර් වලට වඩා ඛණිජ තෙල් නිෂ්පාදිත වල අපනයන වටිනාකම වැඩි වීමක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, මුළු අපනයන වටිනාකමින් සියයට 36 ක් වූ තේ අපනයන තවදුරටත් ප්‍රධාන අපනයන අයිතමය විය.

**1 · 24 වැනි සංඛ්‍යා සටහන**

**1978 – 1980 අපනයන සැකැස්ම**

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ (වරහන් තුල වි ගැ හි දශ ලක්ෂ වලිනි.) | | | මුළු අපනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|
| | 1978 (අ) | 1979 | 1980 | 1978 | 1979 | 1980 |
| 1. තේ .. | 6,401 (327) | 5,722 (284) | 6,170 (287) | 48 | 38 | 36 |
| 2. රබර් . | 2,021 (103) | 2,491 (124) | 2,590 (120) | 15 | 16 | 15 |
| 3. පොල් .. | 1,271 (65) | 1,699 (84) | 1,234 (57) | 10 | 11 | 7 |
| 3.1 මද නිෂ්පාදිත .. | 972 (50) | 1,298 (65) | 754 (35) | 7 | 8 | 4 |
| 3.2 වෙනත් .. | 299 (15) | 401 (20) | 480 (22) | 2 | 3 | 3 |
| 4. සුළු කෘෂි කාර්මික භෝග (ආ) .. | 723 (37) | 825 (41) | 840 (39) | 6 | 6 | 5 |
| 5. කාර්මික අපනයන(ආ) .. | 1,944 (99) | 3,737 (186) | 5,496 (255) | 15 | 24 | 32 |
| 5.1 රෙදිපිළි සහ මසා නිමකළ ඇඳුම් .. | 481 (25) | 1,108 (55) | 1,814 (84) | 4 | 7 | 11 |
| 5.2 ඛණිජ තෙල් නිෂ්පාදිත .. | 945 (48) | 1,926 (96) | 2,999 (139) | 7 | 13 | 17 |
| 5.3 වෙනත් .. | 518 (26) | 703 (35) | 682 (32) | 4 | 4 | 4 |
| 6. මැණික් .. | 531 (27) | 490 (24) | 458 (21) | 4 | 3 | 3 |
| 7. වෙනත් .. | 315 (16) | 309 (15) | 485 (23) | 2 | 2 | 3 |
| මුළු අපනයන .. | 13,206 (674) | 15,273 (759) | 17,273 (803) | 100 | 100 | 100 |

(අ) සංශෝධනය කරන ලදී.
(ආ) තෝරාගත් භාණ්ඩ

මූලය: ශ්‍රී ලංකා රේගුව.

1979 වසර සමග සැසඳීමේදී, 1980 වසරෙහි රුපියල් දශලක්ෂ 6,170 (විගැහි දශ ලක්ෂ 287) ක් වූ තේ අපනයන වටිනාකම සියයට 8 (විගැහි වටිනාකම අනුව සියයට 1) ක වැඩිවීමක් දැක්විය. නිෂ්පාදනයෙහි පහත වැටීමක් තිබියදීද 1979 වසරෙහිවූ අපනයන මට්ටම එසේම පවත්වා ගනිමින්, 1979 වසරෙහි කිලෝ දශ ලක්ෂ 188 ක් වූ තේ අපනයන පරිමාව 1980 වසරෙහිදී කිලෝ දශ ලක්ෂ 185 දක්වා ආන්තික වශයෙන් අඩු විය. 1980 වසරෙහි ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ තේ කිලෝවක් සඳහා වූ සාමාන්‍ය නැ. වි. ස. මිළ රුපියල් 33.41 (විගැහි 1.55) වූ අතර රුපියල් වටිනාකම් අනුව සියයට 10 (විගැහි වටිනාකම අනුව සියයට 2) ක වැඩිවීමක් පෙන්වීය. කොළඹ වෙන්දේසි වලදී අළෙවි කරනලද තේ ප්‍රමාණය, 1979 දී කිලෝ දශලක්ෂ 188 ක සිට 1980 දී

කිලෝග්‍රෑම් දශ ලක්ෂ 178 දක්වා හෙවත් සියයට 5 කින් පහත වැටුණි. කෙසේ වුවද, ලන්ඩන් වෙන්දේසිවලදී අළෙවි කරනලද ශ්‍රී ලංකා තේ ප්‍රමාණය කිලෝ දශ ලක්ෂ 12 ක් ලෙස නොවෙනස්ව පැවතිණි. ලන්ඩන් වෙන්දේසි වලදී අළෙවි වූ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය 1980 දී ශ්‍රී ලංකාව අපනයනය කළ මුළු තේ ප්‍රමාණයෙන් සියයට 6 ක් පමණි. ලන්ඩන් වෙන්දේසි වලදී අළෙවි කරන ලද ලංකා තේ කිලෝවක මිළ විදේශ මුදලින් 1979 දී පැන්ස 105 ක සිට 1980 දී පැන්ස 92 දක්වා අඩුවූවද, කොළඹ වෙන්දේසි වලදී අලෙවි කරනලද තේ කිලෝවක මිළ 1979 දී රුපියල් 12.30 සිට 1980 දී රුපියල් 18.33 දක්වා හෙවත් සියයට 49 කින් වැඩි විය. කොළඹ වෙන්දේසි වලදී වාර්තා වූ ඉහළ මිළ ගණන්, ප්‍රධාන වශයෙන් 1979 වසරෙහි ජූලි මස සිට තොග තේ කිලෝවක් සඳහා වන අපනයන තීරු බද්ද රුපියල් 5.00 කින් අඩු කිරීමෙහිද තරමක් දුරට ශ්‍රී ලංකා රුපියලේ අගය පහත වැටීමෙහිද ප්‍රතිඵලයක් විය. මුළු තේ අපනයන වලින් සියයට 83 ක් පමණ තොග වශයෙන් නැව්ගත කරන ලදී. 1979 වසරට වඩා 1980 වසරෙහි ඉහළ මිළ ගණන් ලැබුනද, සමස්තයක් වශයෙන් මෙම කර්මාන්තය අධික පිරිවැය නිසා ද්‍රවශීලතා ගැටළු වලින් පෙළුණි. තේ වලින් ලද ආදායමින් තුනෙන් එකක් පමණ තීරු බදු සහ ''සෙස්'' වශයෙන් රජය විසින් ලබාගන්නා ලදී.

1980 වසරෙහි දී රුපියල් දශලක්ෂ 2,590 ක් වූ (විගැහි දශ ලක්ෂ 120) රබර් අපනයන වටිනාකම රුපියල් වටිනාකම් අනුව සුළු වැඩිවීමක් පෙන්නුම් කළත්, විගැහි වටිනාකම් අනුව පසුගිය වසරට වඩා අඩුවීමක් පෙන්විය. රුපියල් වටිනාකම් වැඩිවීමට සම්පූර්ණ-යෙන්ම හේතු වූයේ ඉහළ අපනයන මිළ ගණන්ය. ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා රුපියලේ විනිමය වටිනාකම පහත වැටීම පිළිබිඹු කරමින් 1979 රුපියල් 19·44 ක් වූ සාමාන්‍ය නැ.වි ස. මිළ 1980 වසරෙහිදී රුපියල් 21·42 දක්වා හෙවත් සියයට 10කින් වැඩි විය. විගැහි වටිනාකම් අනුව මිනු කල නැ.වි.ස. මිළ සියයට 3 ක වැඩි වීමක් වාර්තා කළේය. 1979 අපනයනය කළ රබර් ප්‍රමාණය කිලෝ දශලක්ෂ 128 ක් වූ අතර කිලෝ දශ ලක්ෂ 7 ක අඩුවීමක් පෙන්වමින් 1980 දී මෙය කිලෝ දශ ලක්ෂ 121 ක් විය. කොළඹ වෙළෙඳපළෙහි රබර් මිළ වැඩිවීමක් දක්නට ලැබුණි. ඒ අනුව ආර්.එස්.එස්· නොම්බර 1 කිලෝවක වාර්ෂික සාමාන්‍ය මිළ රුපියල් 9·15 සිට රුපියල් 10·62 දක්වා සහ ආර්.එස්.එස්. නොම්බර 2 රුපියල් 8·56 සිට රුපියල් 9·73 දක්වා පිළිවෙලින් වැඩි විය. 1980 දී රබර් තොග සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක විය. පසුගිය වසර කිහිපය තුල චීනය විසින් මිලදී ගත් ශ්‍රී ලංකා ස්වාභාවික රබර් ප්‍රමාණයෙහි ක්‍රමික අඩුවීමක් දක්නට ලැබිණි. එහෙයින් මෙම කර්මාන්තයේ අභිවෘද්ධිය තකා අනෙකුත් රටවලට ෂීට් රබර් අපනයනය කිරීම සඳහා පෞද්ගලික අංශය උනන්දු කිරීම අවශ්‍ය වී ඇත.

1979 වසරෙහි රුපියල් දශලක්ෂ 1,699 (විගැහි දශ ලක්ෂ 84) ක් වූ පොල් අපනයන වටිනාකම 1980 දී සියයට 27 ක අඩුවීමක් පෙන්වමින් රුපියල් දශලක්ෂ 1,234 (විගැහි දශලක්ෂ 57) ක් විය. අනෙකුත් පොල් නිෂ්පාදිත වල වටිනාකම රුපියල් දශලක්ෂ 79 කින් වැඩිවූ අතර, පොල් මද නිෂ්පාදිතවල වටිනාකම රුපියල් දශලක්ෂ 544 කින් අඩුවිය. 1980 පොල් අපනයන ඉපයීම්හි දක්නට ලැබුණු මෙම අසතුටුදායක ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සැපයුමෙහි දක්නට ලැබුණු සීමාවන්ය. ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන වන කොප්පරා, පොල් තෙල් සහ කපාපු පොල් වල අපනයන පරිමාවන් අඩුවිය. ගෙඩි ගණනින් මිනු කල අපනයන පරිමාව 1979 දී ගෙඩි දශ ලක්ෂ 537 ක සිට 1980 දී ගෙඩි දශ ලක්ෂ 239 දක්වා හෙවත් සියයට 55 කින් අඩුවිය. ශ්‍රී ලංකාවේ පොල් අපනයන නිෂ්පාදිතයන්ගෙන් ප්‍රධාන ස්ථානය හිමිකර ගන්නා කපාපු පොල් සඳහා 1980 වසරෙහි ලන්ඩන් වෙළෙඳපළෙහි වූ සාමාන්‍ය මිළ පසුගිය වසරට වඩා සුළු වශයෙන් අඩුවිය. කෙසේවුවද, 1980 දී නැ·වි·ස· මිළ ගනන් සහ කොළඹ වෙළෙඳපල මිළ ගනන් සැළකියයුතු ලෙස වැඩිවිය. මෙයට තරමක් දුරට හේතුවූයේ ශ්‍රී ලංකා රුපියලෙහි විනිමය වටිනාකම මෙම කාලච්ඡේදය තුල ක්ෂය වීමයි.

රුපියල් වටිනාකම අනුව සුළු කෘෂිකාර්මික භෝග වල අපනයන ඉපැයීම් 1979 දී රුපියල් දශලක්ෂ 825 ක සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 840 දක්වා සුළු වශයෙන් වැඩි වුවද විගැහි වටිනාකම් අනුව එය සියයට 5 ක අඩුවීමක් වාර්තා කළේය. මෙම නිෂ්පාදිත වල මිළ, ලෝක භාණ්ඩ වෙළෙඳපල වල වාසිදයක ලෙසට හැසිරුනත් සැපයුම් අවහිර තාවයන් පැවති නිසා මෙම ඉහළ අපනයන මිළ ගණන් වලින් වාසි ලබා ගැනීමට නොහැකි විය. පුවක්, කුරුඳු, කරාබු නැටි, කජු, අබ, කොකෝවා සහ අනෙකුත් ඇට වර්ගයන්හි අපනයන පරිමාව සුළු වශයෙන් වැඩිවූ අතර කෝපි, ගම්මිරිස්, සාදික්කා කරදමුංගු, තල, බුලත්කොළ, දුම්කොළ, පැපොල් කිරි සහ අනෙකුත් වාෂ්පශීල තෙල් අපනයන පරිමාව සැළකිය යුතු ලෙස අඩු විය. රුපියල් වටිනාකම් සහ විගැහි වටිනා කම් අනුව දියුණුවක් පෙන්වූ එකම අංශය වූයේ රුපියල් දශ ලක්ෂ 3,737 (විගැහි දශ ලක්ෂ 186) ක සිට රුපියල් දශ ලක්ෂ 5,496 (විගැහි දශ ලක්ෂ 255) දක්වා හෙවත් සියයට 47 කින් වැඩිවූ කාර්මික අපනයනයන්ය. රුපියල් දශ ලක්ෂ 1,814 (විගැහි දශ ලක්ෂ 84) ක් වූ රෙදිපිළි සහ ඇඟලුම් අපනයන මුළු කාර්මික අපනයනයන්ගෙන් සියයට 33 ක් වූ අතර රුපියල් දශ ලක්ෂ 2,999 විගැහි දශලක්ෂ 139) ක් වූ ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන මුළු කාර්මික අපනයන්ගෙන් ප්‍රධාන තැන හිමිකර ගත්තේය. ඛණිජ තෙල්වල අපනයන ඉපැයුම් වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ ඒවායේ මිළ ඉහල යාමයි. රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ඉපැයීම් වැඩිවීම මිළ සහ පරිමාව යන දෙකම වැඩිවීමෙහි ප්‍රතිඵලයක් විය. 1979 ඒකක දශලක්ෂ 34 ක් වූ ඇඟලුම් අපනයන පරිමාව 1980 දී ඒකක දශලක්ෂ 52 දක්වා වැඩි විය. මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් කර්මාන්ත සැකසුම් කලාපයේ රෙදිපිළි අපනයන රුපියල් දශලක්ෂ 470 පමණ වෙයයි ඇස්තමේන්තු කර ඇත. රාජ්‍ය මැණික් සංස්ථාව සැපයූ දත්ත වලට අනුව සැළකිය යුතු වැඩි වීමක් පෙන්වූවද, රේගු සංඛ්‍යා අනුව 1980 දී මැණික් වල අපනයන ඉපයීම් අඩුවිය.

සමස්තයක් වශයෙන් 1980 දී අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය දිරි ගන්වන සුළු එකක් වූයේ නැත. ඇත්ත වශයෙන්ම එය තරමක් දුරට බලාපොරොත්තු විරහිත වූවකි. කර්මාන්ත අංශය හැරුණු විට සියළුම අංශයන්ගේ අපනයන පරිමාව පහත වැටුණි. ලෝක උද්ධමනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තර මිළ ගණන් ඉහළ යාම අපනයන ඉපැයුම්වල සුළු දියුණුවක් ඇති කරවීමට හේතුවිය. කෙසේ වුවද 1977 සිට ශ්‍රී ලංකාවේ වෙළෙඳ අනුපාතයේ පිරිහීම සළකා බලන කල, පාරම්පරික අංශයේ දයාදයන් වැඩිදියුණු කරන අතරම අපනයනයන්ගේ වර්ධන මට්ටමද වැඩි කිරීම සඳහා දැඩි ඒකාග්‍රතාවයකින් යුත් ප්‍රයත්නයක් දැරිය යුතුව ඇත. බොහෝදුරට එකම මට්ටමක පවතින තේ ඉල්ලුම හා රබර් සහ පොල් අපනයනයන්ගේ වර්ධනයට බාධාකරන සැපයුම් අවහිරතා ගැන සළකා බලන කල පාරම්පරික නොවන අපනයන සංවර්ධන කිරීම සඳහා දැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වී ඇත. රබර් සහ අනෙකුත් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අමු ද්‍රව්‍ය ලෙස ප්‍රයෝජනයට ගනු ලබන කෘෂි පදනමක් ඇති නිෂ්පාදිත භාණ්ඩ එසේ සංවර්ධනය කළහැකි වූ එක් අංශයක් විය හැක. ප්‍රාග්ධන භාණ්ඩ හා ආයෝජන භාණ්ඩයන්ට ඇති වැඩි වැදගත්කම හා ලෝක උද්ධමනය නිසා ආනයන වටිනාකම් වල ඇතිවන අඛණ්ඩ වැඩිවීම ගැන සලකා බලන කල, වෙළෙඳ හිඟය දිගින් දිගටම වැඩි වීම වළක්වා ගතහැකි එකම පිළියම වනුයේ ප්‍රබල හා තීරණාත්මක අපනයන සංවර්ධන වැඩ පිළිවෙළෙකි.

**ආනයන**

1979 වසරේ රුපියල් දශ ලක්ෂ 22,560 (විගැහි දශ ලක්ෂ 1,121) ක වියදම සමග සසඳන විට සියයට 49 (විගැහි වටිනාකම අනුව සියයට 39) ක වැඩිවීමක් පෙන්වන 1980 ආනයන වියදම රුපියල් දශලක්ෂ 33,637 (විගැහි දශ ලක්ෂ 1,563) විය. ආනයන වටිනාකමේ මෙම තියුණු වැඩිවීම ප්‍රධාන වශයෙන්ම ආනයන මිළ දර්ශකය සියයට 43 කින් වැඩි වීමෙහි ප්‍රතිඵලයකි. ආනයන පරිමාවද සියයට 14 කින් වැඩි විය. කෙසේ වෙතත්

## 1 · 25 සංඛ්‍යා සටහන

## 1978 – 1980 ආනයන වියදම්

| කාණ්ඩය | වටිනාකම | | | | | | මුළු ආනයන වල ප්‍රතිශතකයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | | | |
| | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1980 | 1978 | 1979 | 1980 |
| 1. පාරිභෝගික භාණ්ඩ | 5,618 | 7,824 | 9,884 | 287 | 389 | 459 | 38 | 35 | 29 |
| 1·1 ආහාර සහ පාන වර්ග | 4,127 | 4,807 | 6,134 | 211 | 239 | 285 | 28 | 21 | 18 |
| 1·1·1 සහල් | 689 | '884 | 756 | 35 | 44 | 35 | 5 | 4 | 2 |
| 1·1·2 පිටි | 2,192 | 1,691 | 1,788 | 112 | 84 | 83 | 15 | 8 | 5 |
| 1·1·3 සීනි | 620 | 929 | 1,915 | 32 | 46 | 89 | 4 | 4 | 6 |
| 1·2 රෙදිපිළි සහ ඇඟලුම් | 531 | 1,536 | 1,721 | 27 | 76 | 80 | 4 | 7 | 5 |
| 1·3 වෙනත් | 959 | 1,481 | 2,029 | 49 | 74 | 94 | 7 | 7 | 6 |
| 2. අන්තර් භාණ්ඩ | 5,591 | 9,143 | 15,495 | 286 | 454 | 720 | 38 | 41 | 46 |
| 2·1 ඛනිජ තෙල් | 2,403 | 3,912 | 8,090 | 123 | 194 | 376 | 16 | 17 | 24 |
| 2·2 පොහොර | 252 | 673 | 1,333 | 13 | 33 | 62 | 2 | 3 | 4 |
| 2·3 රසායනික ද්‍රව්‍ය | 446 | 502 | 544 | 23 | 25 | 25 | 3 | 2 | 2 |
| 3. ආයෝජන භාණ්ඩ | 3,367 | 5,459 | 8,141 | 172 | 271 | 378 | 23 | 24 | 24 |
| 3·1 යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,846 | 2,900 | 4,212 | 94 | 144 | 196 | 13 | 13 | 13 |
| 3·2 ගමනා ගමන උපකරණ | 988 | 1,615 | 2,421 | 50 | 80 | 113 | 7 | 7 | 7 |
| 3·3 ගොඩනැගිලි ද්‍රව්‍ය | 150 | 368 | 610 | 8 | 18 | 28 | 1 | 2 | 2 |
| 4. වර්ග නොකල ආනයන | 110 | 134 | 118 | 30 | 7 | 6 | 1 | 1 | 1 |
| මුළු එකතුව | 14,687 | 22,560 | 33,637 | 774 | 1,121 | 1,563 | 100 | 100 | 100 |

මූලය: ශ්‍රී ලංකා රේගුව.

ආනයන සංයුතියේ ව්‍යුහාත්මක වෙනස්වීම 1980 දී ද, තවදුරටත් දක්නට ලැබුණි මුළු අන්තර් භාණ්ඩ ගණයෙහි සාපේක්ෂ කොටස සියයට 41 සිට සියයට 46 දක්වා වැඩි වූ අතර, ආනයන වලින් පාරිභෝගික භාණ්ඩ වල කොටස 1979 දී සියයට 35 සිට සියයට 29 දක්වා අඩු විය. ආයෝජන භාණ්ඩ වල කොටස නොවෙනස්ව සියයට 24 මට්ටමෙම පැවතිණි. ආනයන මිළෙහි තියුණු වැඩිවීමක් තිබියදීත්, ප්‍රාග්ධන සම්පාදනය වැඩි දියුණු කරනු වස්, සම්පත් වලින් වැඩි ප්‍රමාණයක් ආයෝජන උත්පාදක කාර්යයන් සඳහා යොමු කරවීමේ රජයේ අරමුණ සාර්ථක වූ බව පෙනෙන්නට තිබේ. කෙසේ වෙතත්, බොරතෙල් මිළෙහි තියුණු වැඩිවීම, සම්පත් අනිකුත් ප්‍රයෝජන සඳහා යෙදවීම වැලැක්වූ නිසා එය ප්‍රධාන පසු බෑස්මක් විය.

වර්ෂය තුලදී ආනයනය කරනු ලැබූ ආයෝජන භාණ්ඩවල වටිනාකම සියයට 49 (විගැහි අනුව සියයට 39) ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 8,141 (විගැහි දශ ලක්ෂ 378) ක් විය. යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයන, ආයෝජන භාණ්ඩ වලින් භාගයකට වඩා වැඩි වූ අතර, ශේෂය ප්‍රවාහණ උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍යය වලින් සමන්විත විය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන ඉකුත් වසරට වඩා සියයට 45 කින් වැඩි වූ අතර, ගොඩනැගිලි ද්‍රව්‍යය සහ ප්‍රවාහන උපකරණ පිළිවෙලින් සියයට 66 සහ සියයට 50 කින් වැඩිවිය. කෙසේ වෙතත්, මෙම අංශයේ වාර්තා ගත වැඩිවීමට ප්‍රධාන වශයෙන් දයක වූයේ, ආනයන පරිමාවේ ප්‍රසාරණයයි. මෙය, ආනයන මිළ වැඩිවීම මඟින් තවත් ශක්තිමත් විය. ආයෝජන භාණ්ඩ කාණ්ඩයෙහි ආනයන පරිමා දර්ශකය සියයට 19 කින් වැඩි වූ අතර මිළ දර්ශකය සියයට 10 කින් වැඩි විය. ගොඩනැගිලි ද්‍රව්‍ය කාණ්ඩයෙහි මිළ දර්ශකය සියයට 63 කින් වැඩි වූ අතර, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ පිළිවෙලින් සියයට 14 සහ සියයට 10 කින් වැඩි විය. කෙසේ වෙතත්, මිළ දර්ශකයන්හි වාර්තාවූ වැඩි වීම් රුපියල් වටිනාකම් වලින් නිසා ශ්‍රී ලංකා රුපියලේ විනිමය වටිනාකම ක්ෂයවීම සඳහා නිසි ගැලපීම් කළයුතු වේ.

ප්‍රමාණය සහ මිළ යන දෙකම වැඩිවීමේ හේතුවෙන් ගිය වර්ෂයට වඩා සියයට 69 කින් ඉහළ යාමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 15,495 (විගැහි දශලක්ෂ 720) ක් වූ ආයෝජන භාණ්ඩ ආනයන, 1980 ආනයන වලින් විශාලම කොටස විය. අන්තර් භාණ්ඩවල පරිමා දර්ශකය සියයට 53 කින් වැඩිවූ අතර, මිළ සියයට 51 කින් වැඩි විය. මිළ සියයට 80 කින් සහ පරිමාව සියයට 29 කින් වැඩිවූ බොර තෙල් ආනයන, අන්තර් භාණ්ඩවල මුළු වටිනාකමෙන් සියයට 47 ක් විය. බොර තෙල් සඳහා වූ මුළු වියදම ඉකුත් වසරට වඩා සියයට 133 කින් වැඩිවිය. පොහොර ආනයන වියදමද ආනයන ප්‍රමාණය මෙන්ම මිළද ඉහල යාමේ හේතුවෙන් වැඩිවිය.

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 1979 රුපියල් දශ ලක්ෂ 7,824 (විගැහි දශ ලක්ෂ 389) සිට 1980දී රුපියල් දශලක්ෂ 9,834 (විගැහි දශලක්ෂ 459) දක්වා සියයට 26 කින් වැඩි විය. කෙසේ වෙතත් මෙම කාණ්ඩයෙහි සාපේක්ෂ කොටස 1979 දී සියයට 35 සිට 1980 දී සියයට 29 දක්වා අඩුවිය. ආහාර හා බීම වර්ග සඳහා වියදම වැඩි වූයේ මිළ වැඩි වීම නිසාය. ආනයන පරිමා දර්ශකයේ තියුණු අඩුවීමක් වාර්තා කෙරිණි. කෙසේ වෙතත්, ආනයන මිළ දර්ශකය අනුව මිළ ගණන් සියයට 55 කින් වැඩිවිය. ආනයන පරිමාව අඩු වීමට හේතුවූයේ, සහල්, පිටි සහ සීනි ආනයන ප්‍රමාණය අඩුවීමයි. වසර තුළ සීනි ආනයන මිළ තියුණු ලෙස වැඩිවීම මිළ දර්ශකය ඉහළ යාමට හේතු විය.

කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ ඇතුළුව අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 37 කින් වැඩිවූ අතර රෙදිපිළි ආනයන සියයට 12 කින් වැඩි විය. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ලෙස වර්ග කළහැකි සමහර අයිතමයන්ද අඩංගු වූ මෙම කාණ්ඩයේ ආනයන මුළු ආනයන වටිනාකමෙන් සියයට 6 ක් පමණක් විය. ඖෂධීය හා බෙහෙත් නිෂ්පාදන සහ ටයර් හා ටියුබ් ඉවත් කළහොත් මෙකී කොටස මුළු ආනයන වලින් සියයට 5 ටත් වඩා අඩු වේ.

නිශ්කාෂණ අවස්ථාවේදී රේගුව විසින් ගෙවීමේ මාධ්‍යයන් අනුව ආනයන වර්ග නොකරන හෙයින්, 'ආධාර යටතේ කරන ආනයන' පිළිබඳ වෙනම වාර්තා නොමැත. කෙසේ වෙතත්, විදේශාධාර උපයෝජනය සඳහා මුදහැරීම පිළිබඳ ලබාගත හැකි දත්ත පදනම් කරගෙන, මුළු ආනයන වලින් වැදගත් තැනක් ගන්නා ආධාර යටතේ කරන ආනයනයන් පිළිබඳ ආසන්න තක්සේරුවක් කිරීමට පුළුවන[1]. 1979 දී වූ රුපියල් දශලක්ෂ 4,269 (විගැහි දශලක්ෂ 212) සමග සසඳන කල 1980 වර්ෂය සඳහා ආධාර යටතේ කරන ආනයන රුපියල් දශලක්ෂ 4,681 (විගැහි දශ ලක්ෂ 217) ලෙසට ඇස්තමේන්තු කර ඇත. ආධාර යටතේ කරන ආනයන මුළු ආනයන වල ප්‍රතිශතයක් වශයෙන් 1979 දී සියයට 19 ක සිට විවරණයට භාජනය වන වර්ෂයේදී සියයට 14 දක්වා අඩුවී ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල, ආනයන මිළ වැඩි වීම නිසා සැළකියයුතු විදේශ විනිමය ප්‍රමාණයක් පිටරට වලට ඇදී ගියද, ආයෝජන උත්පාදිත ආනයන කෙරෙහි සම්පත් යොමු කරවීමේ රජයේ ප්‍රතිපත්තිය සාර්ථක වී ඇති බව, ආනයන අංශයේ ඇතිවූ වෙනස්කම් මගින් පෙන්නුම් කරයි. ආනයන පරිමාව වැඩි වූයේ සංවර්ධන ජනිත භාණ්ඩ ගණයෙහි ය. මෙය බොහෝදුරට ආහාර සහ පාන වර්ගවල ආනයන ප්‍රමාණය අඩු කරවමින් සිදු වූවකි. සංවර්ධනය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයට වඩා පුළුල් විවරණයක යෙදීමේදී, අනෙකුත් භාණ්ඩ වලට වඩා වැඩි වේගයකින් ප්‍රාග්ධන භාණ්ඩ ආනයන වැඩිවීමේ ප්‍රවණතාවය දිරි ගන්වන සුළු එකක් වූවා සේම තරමක්දුරට අපහසුතා ඇති කරවන්නක් ද විය. සීමිත සම්පත් සංවර්ධනය සහ පරිභෝජනය යන එකිනෙකට තරගකාරී අවශ්‍යතාවයන් අතර බෙදහැරිය යුතුව ඇත. මේ සම්බන්ධයෙන් නියම තුලනය තීරණය කෙරෙන්නේ ආයෝජන සහ අවසන් නිමැවුම් ධාරාව පිළිබඳ කාල රටාව මගිනි.

### විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය

පසුගිය වර්ෂ දෙකේදී මෙන් මෙම වර්ෂයේදී ද විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ලක්ෂණය වූයේ නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය සහ ඉහළ වර්ධන මට්ටමක් ලබා ගැනීම සඳහා අපනයන අංශයට ආධාර කිරීමයි.

අපනයන සංවර්ධනය කිරීමට තුඩුදෙන පරිදි ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට ආධාර කරනු වස් 1979 වර්ෂය අවසාන භාගයේදී පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (ශ්‍රී.ල.අ.ස.ම.) 1980 වර්ෂයේදී අපනයන දිරිගැන්වීමේ ව්‍යාපාරයෙහි ක්‍රියාකාරී ලෙස නියැලී සිටියේය. එය සතුවූ කාර්යයන් අතර අපනයන සංවර්ධනය කිරීම සඳහා වූ සැළසුම් පිළිබඳව රජයට උපදෙස් දීම, ජාතික අපනයන සංවර්ධන යෝජනා ක්‍රම සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක වීම පිළිබඳව සොයා බැලීම, අපනයන ප්‍රශ්න විසඳීමෙහි ලා ප්‍රමුඛත්වය දරන අතරම අපනයන නිෂ්පාදිත සංවර්ධනය කිරීම සහ අපනයන වෙළෙඳපල පිළිබඳ පර්යේෂණ කරගෙන යාමත් අපනයන කරුවන්ට අවශ්‍ය වූ සේවාවන් සැපයීමත් ඇතුළත්ය. නිෂ්පාදිත අංශයෙහි සහ ක්‍රියාකාරී අංශයෙහි (උදා: අපනයන මූල්‍යකරණය) යන දෙඅංශය කෙරෙහිම බලපාන්නාවූ මූලික සීමාකරණයන් ක්‍රමානුකූලව හඳුනා ගැනීමට මණ්ඩලය උත්සාහයක් දරා ඇත. මෙම අධ්‍යයනයන් පදනම් කරගෙන ස්වර්ණාභරණ, සුදු කොහු කෙඳි නිෂ්පාදිත, තේ මළු හා පැකට් කළ තේ සහ රබර් නිෂ්පාදිත ආදිය සඳහා අමතර සහනබලයන් දෙන ලදී. මෙහි ලා මණ්ඩලය විසින් සාධාරණ පිරිවැයක් යටතේ අපනයන කිරීමට හැකි පරිදි භාණ්ඩ නිෂ්පාදනය සඳහා ණය සැපයීමට යෝජනා ක්‍රම ආරම්භ කර ඇතිවාක් මෙන්ම අපනයනය සඳහා ස්වර්ණාභරණ තැනීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය පිණිස අවසර පත්‍ර නිකුත් කිරීමද සිදු කරන ලදී.

1 ආධාර යටතේ කරන ආනයන වල වටිනාකම සම්පූර්ණ භාණ්ඩ ආධාර ඇතුළු ව්‍යාපෘති ආධාර, ආහාර ආධාර සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංගණනය යන ඒවායින් සියයට 75 ක් හැටියට තක්සේරු කර ඇත.

අපනයන කරුවන් දිරිගැන්වීම සඳහා අපනයන ව්‍යාප්ත කිරීමේ දීමනා ක්‍රමයක් සහ ප්‍රධාන අපනයන ත්‍යාග ක්‍රමයක්ද ක්‍රියාත්මක විය. ඉක්මණින් ආපසු ගෙවීම් ලබා ගැනීමට හැකිවනු පිණිස ආනයන තීරුබදු ප්‍රතිදාන ක්‍රමය වෙනස් කරනු ලැබීය. ග්‍රාහක යෝජනා ක්‍රම සඳහාත් ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනවල සහභාගිවීම සඳහාත් මූල්‍ය ආධාර සපයන ලදී. කරදමුංගු සහ ගම්මිරිස් ආදි වූ සුළු අපනයන භෝග වගා කිරීම සඳහා නිෂ්පාදකයන් හා අපනයන කරුවන්ගේ සහභාගිත්වයෙන් සීමිත වගකීම් සහිත සමාගම් පිහිටුවීමටත්, දැනට අලෙවි දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන ටින් කිරීමේ කම්හල් පවරා ගැනීම පිළිබඳව සොයා බැලීමටත් යෝග්‍යතා අධ්‍යයනයන් සැළකිල්ලට භාජනය කර ඇත. මීට අමතරව සමුද්‍ර නිෂ්පාදන සඳහා සංකීර්ණ වූ පර්යේෂණාගාරයන් පිහිටුවීම අරභයා මුදල් සැපයීමද අපනයන සංවර්ධන මණ්ඩලය විසින් භාර ගෙන ඇත. මෙම මණ්ඩලය පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයෙහි ආධාරද ඇතිව අත්යන්ත්‍ර ප්‍රේෂකර්මාන්ත වෙළෙඳපළ දියුණු කිරීම සඳහා සැළැස්මක් ආරම්භකර ඇතිවාක් මෙන්ම විශේෂිත නිෂ්පාදන කිහිපයක සැසයුම් තත්ත්වය පිළිබඳ සමීක්ෂණද පවත්වා ඇත.

අපනයන සංවර්ධන මණ්ඩලයෙහි කටයුතු වලට මුදල් සැපයීම අරමුණුකොට අපනයන සංවර්ධන අරමුදලක් මෙම වර්ෂය තුලදී පිහිටුවන ලද්දේය. මෙම අරමුදලට මුදල් ලැබෙන ප්‍රධාන මාර්ගය වූයේ තෝරා ගනු ලැබූ අපනයන සහ ආනයන මත පණවන ලද අපනයන සංවර්ධන (සෙස්) බද්දයි. සියයට 50 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක තීරු බදු ගෙවීමට නියමිත ආනයන මත ගෙවිය යුතු බද්දෙන් සියයට 10ක අමතර බද්දක් පැනවූ අතර තෝරාගත් සුළු අපනයන භෝග මත ඒවායේ අපනයන (නැ. වි. ස.) වටිනාකමින් සියයට 2 ක සෙස් බද්දක් පනවනු ලැබීය.

1980 වර්ෂයේදී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (ශ්‍රී.ල අ.ණ.ර.ස.) අපනයන ණය සහතික කිරීම සහ රක්ෂණය කිරීම මගින් අපනයන දිරිගැන්වීමේ ව්‍යාපාරයෙහි කාර්යශීලිවම නියැලී සිටියේය. සහතික කිරීම් වල වටිනාකම 1980 වර්ෂයේදී අපේක්ෂිත ඉලක්කය ඉක්මවමින් පසුගිය වර්ෂයේ දී ට වඩා සියයට 117 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. ශ්‍රී.ල.අ.ස.ම. සහ ශ්‍රී.ල.අ.ණ.ර.ස. යන ආයතන දෙක මගින් දෙනු ලැබූ විශේෂිත සානු බලයන්ට අමතරව පොදු අයවැය ප්‍රතිපත්ති යටතේ අපනයන කරුවන්ට දෙනු ලැබූ තවත් සානුබලයන් ගණනාවක්ම තිබුණි. දේශීය ආදයම් පණත යටතේ අපනයන කරුවන්ට සහ අපනයන සඳහා නිෂ්පාදනය කරන අයට බදු සහන කාල සීමාවන් හා ආයෝජන සහනයන් සපයන ලදී. නිෂ්පාදිත භාණ්ඩ අපනයන තවදුරටත් ව්‍යාපාර පිරිවැටුම් බදු වලින් නිදහස්ව පැවැතිණි.

1980 වර්ෂය ආරම්භයේදී භාණ්ඩ 17 ක් අපනයනය සඳහා බලපත්‍ර ලබාගත යුතු වූ අතර වර්ෂය තුලදී කඩදසි සහ ඝන කඩදසිද මෙම ලැයිස්තුවට ඇතුළත් කරන ලදී. තේ මළු සහ පැකට් කළ තේ අපනයනය දිරි ගැන්වීම අරභයා තේ මළු සඳහා වූ අපනයන බද්ද කිලෝවකට රුපියල් 10·50 සිට රුපියල දක්වාද පැකට් කළ තේ සඳහා වූ බද්ද කිලෝවකට රුපියල් 10·50 සිට රුපියල් 8·50 දක්වාද අඩු කරනු ලැබිය. දේශීය නිෂ්පාදකයන් සඳහා වූ ලාභාංශය ඉහළ නැංවීම සඳහා පොල් මද නිෂ්පාදිත අපනයන සඳහා වූ තීරුබද්ද 1980 ජූනි මාසයේදී අඩුකරනු ලැබීය. සියළුම වර්ගවල රබර් අපනයන සඳහා සෑම මිල මට්ටමකදීම වූ බද්ද 1980 නොවැම්බර් මාසයේදී සියයට 15 කින් අඩු කරනලදී.

විවරණයට භාජනය වන වර්ෂයේදී ආනයන බදු කිහිප වතාවක් සංශෝධනය කරනු ලැබීය. ඌණ සැපයුම් කින් යුක්ත වූ තුනී ලෑලි දෙරවල්, මුළුතැන් ගෙයි බේසම්, නාන කාමර බේසම්, ඇස්බැස්ටෝස්. කෙඳි වැහුම්කර, ගිනි ආවරණ ඇඳුම්, ඇස්බැස්ටෝ රෙදි සහ ගෙදර පාවිච්චියට ගන්නා සනීපාරක්ෂක භාණ්ඩ ආදියෙහි සැපයුම වැඩි කිරීම සඳහා ඒවා සඳහා වූ ආනයනබදු අඩු කරන ලදී. රජයේ අයභාරය වැඩි කිරීම අරමුණු කොට මත්පැන්, බීඩි එතීමට ගන්නා කොළ සහ නිෂ්පාදනය නොකළ දුම්කොළ ආදියෙහි ආනයන බදු වැඩි කරන ලදී. විදුලි උපකරණ හා අමතර කොටස් ද, ඔටෝ ට්‍රයිෂෝ හැර අනිකුත් මෝටර් බයිසිකල් ද, අත් ඔර්ලෝසු, රූපවාහිනී යන්ත්‍ර සහ මගින් ගෙනයන වාහන වර්ග වලද ආනයන බදු වැඩි කරනු ලැබීය. ධීවර කර්මාන්තයෙහි යොදා ගනු ලබන උපකරණ පිරිවැය අඩුකිරීම සඳහා ධීවර කර්මාන්තයෙහි යොදා ගනු ලැබූ කෘත්‍රිම තුල් දැල් සඳහා වූ ආනයන බදු අඩු කරන ලදී.

ආනයන තීරු බදු දිගටම සැළකිල්ලට භාජනය කිරීම සඳහාත් යෝග්‍ය වූ තීරු බදු රාමුවක් යෝජනා කිරීම සඳහාත් 1980 ඔක්තෝබර් මාසයේදී "තීරුබදු පිළිබඳ ජනාධිපති කොමිසමක්" පත් කරන ලදී.

ජාත්‍යන්තර ක්ෂේත්‍රයේදී ශ්‍රී ලංකාව රබර් ගිවිසුම අත්සන් කළ අතර ජාත්‍යන්තර තේ ගිවිසුමක් සඳහා වූ සාකච්ඡාවලටද සහභාගි විය. එක්සත් ජාතීන්ගේ වෙළෙඳ හා සංවර්ධන සම්මේලනයෙහි මූලිකත්වය යටතේ පිහිටුවනු ලැබූ 'පොදු අරමුදල' පිළිබඳ ගිවිසුමට එකඟත්වය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය පියවරද ගන්නා ලදී. 1980 වර්ෂයේදී ශ්‍රී ලංකා/චීන වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම දීර්ඝ කරනු ලැබීය. මෙම සන්ධානයට අනුව 1981 දී ශ්‍රී ලංකාව සහල් ටොන් 80,000 ක් චීනයෙන් මිලදී ගැනීමට එකඟ වූ අතර චීනය ලංකාවෙන් රබර් ටොන් 20,000 ක් මිලදී ගැනීමට එකඟ වූයේය. පිලිපීනය සහ මාලදිවයින සමග සාමාන්‍ය වෙළෙඳ ගිවිසුම් මාලාවක්ද අත්සන් කරනු ලැබීය. රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් පිළිබඳව 1980 දී අමෙරිකා එක්සත් ජනපදය සහ ස්වීඩනය සමග ගිවිසුම් අත්සන් කරන ලදී. ඩෙන්මාර්කය සහ ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව යන රටවල වෙළෙඳ සහ ආයෝජන මධ්‍යස්ථාන විවෘත කළ අතර ශ්‍රී ලංකාව මෙම වර්ෂයේදී ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන කීපයකටද සහභාගී වූයේය.

**අභ්‍යන්තර වෙළෙඳාම**

විදේශීය වෙළෙඳාමෙහි දී මෙන්ම අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියේදී ද මූලික පරමාර්ථය වූයේ නිෂ්පාදන අංශවල කටයුතු මිළ ක්‍රමය මගින් මෙහෙයවනු ලබන අතර තරගකාරී වෙළෙඳ පළ මගින් පාරිභෝගික රුචීන් ආරක්‍ෂා කරන විධියේ නිදහස් වෙළෙඳ ක්‍රමයකට ක්‍රමානුකූලව ගමන් කිරීමයි. ප්‍රතිපත්තිමය අතින් නිදහස් වෙළෙඳාමට මුල්තැන දුන්නද සමහර අවස්ථා වලදී පාරිභෝගිකයා මෙන්ම නිෂ්පාදකයාද ආරක්ෂා කිරීම සඳහා වෙළෙඳපළෙහි මැදිහත් වීම අවශ්‍ය විය. රාජ්‍ය අංශයේ ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන අතර තරගකාරී බව දිරිගැන්වීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන කිහිපයක් මෙතෙක් දුරට භුක්ති විඳි ඒකාධිකාරී අයිතීන් ඉවත් කරන ලද අතර අළුත් විධියේ ව්‍යාපාර කටයුතු දියුණු කරගෙන යාමෙහි ලා මෙකී ආයතන වඩා ක්‍රියාකාරීව සහභාගි වනු ඇතැයි බලාපොරොත්තු විය. කෙසේ වුවද, කරවල, ළූණු, මිරිස්, ගිනිපෙට්ටි සහ උදළු තල ආදී ඇතැම් අත්‍යාවශ්‍ය භාණ්ඩ කිහිපයක් ආනයනය කිරීම නිෂ්පාදකයා ආරක්‍ෂා කිරීමේ පරමාර්ථයෙන් රාජ්‍ය අංශයට සීමා කරනු ලැබීය. මෙකී භාණ්ඩ ආනයන කරනු ලැබූ එකම හේතුව දේශීය නිෂ්පාදනයෙහි ඌණතා පිරිමැසීමයි. දේශීය නිෂ්පාදකයා ආරක්‍ෂා කරන අතරම මෙකී අත්‍යවශ්‍ය භාණ්ඩවල අඛණ්ඩ සැපයුම සහතික කිරීම සඳහා එකී භාණ්ඩ හිඟවූ කාලවලදී ආනයනය කිරීමට වෙළෙඳ අමාත්‍යාංශය පියවර ගත්තේය. අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව විසින් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සැපයුම පිළිබඳව සතිපතා වෙළෙඳපළ සමීක්ෂණ පවත්වා ඒවායේ හිඟයයන් ඇතිවූ විට වෙළෙඳ අමාත්‍යාංශයට ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබීය අත්‍යාවශ්‍ය භාණ්ඩ වෙළෙඳාමෙහි ලා වූ බෙද හැරීමේ හා මිළ කිරීමේ ප්‍රශ්න, වෙළෙඳ අමාත්‍යාංශය මහ බැංකුව සහ ප්‍රධාන සැපයුම් හා පාරිභෝගික සංවිධාන විසින් නියෝජනය කරනු ලැබුවාවූ පාරිභෝගික ආරක්‍ෂණ කමිටුවේ නිරන්තර රැස්වීම් වලදී සාකච්ඡාවට භාජනය කරනු ලැබීය.

වෙළෙඳාම පිළිබඳ දැඩි පාලන ඉවත් කර ඇති කාලයකදී වෙළෙඳ කටයුතු ඒකාග්‍රතාවයකින් යුතුව ක්‍රියාත්මක වීම පිණිස කිසියම් විධිමත් යන්ත්‍රණයක් අවශ්‍ය වේ. අභ්‍යන්තර වෙළෙඳාමෙහි සාධාරණ වෙළෙඳ රටාවක් පවත්වා ගැනීම පිණිස අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික ආරක්‍ෂණ පණත, මිල පාලන පණත සහ කිරුම් හා මිනුම් ආඥා පණත පරිපාලනය සහ ක්‍රියාත්මක කරන ලදී.

සිල්ලර වෙළෙඳ මට්ටමේදී පාරිභෝගිකයා ගෙන් එකිනෙකට වෙනස් මිළ අය කිරීමෙන් පාරිභෝගිකයා ආරක්ෂා කරනු සඳහා, පාරිභෝගික ආරක්ෂක පණත යටතට ගැණෙන්නාවූ පාරිභෝගික භාණ්ඩ 315 ක් පමණ ගණුදෙනු කරන්නාවූ සියළුම වෙළෙඳුන්ට, එම භාණ්ඩ අළෙවි කරනු ලබන සිල්ලර මිල ගණන් ප්‍රදර්ශනය කිරීමට බල කරනු ලැබීය. මෙම පණත යටතේ ආඥාවන් මාලාවක් ද පණවනු ලැබීය.

පාරිභෝගික අධ්‍යාපනික වැඩ සටහන් සහ පාරිභෝගික සංවිධාන සංවර්ධනයට මුදල් ලබාදීම සඳහා පාරිභෝගික ආරක්ෂණ අරමුදලක් පිහිටුවන ලදී. වර්ෂය අවසානය වන විට අරමුදල වෙනුවෙන් බැරවී තිබූ ප්‍රමාණය රුපියල් 1,15,000 වූයේය. නිදහස් තරඟකාරී වෙළෙඳපළක ප්‍රයෝජනවත් භාවය පාරිභෝගිකයාට අවබෝධ කරනු සඳහා අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව විසින් 1980 දී මහ පොළ වෙළඳ ප්‍රර්ශන සහ අනිකුත් ප්‍රදර්ශන වලදී පාරිභෝගික අධ්‍යාපන කවුළු පවත්වා ගෙන යන ලදී. පාරිභෝගික සමිති පිහිටුවීම පටන් ගත් අතර වර්ෂය අවසාන වන විට එවැනි සමිති 905 ක් පිහිටුවන ලදී.

## සංචාරක ව්‍යාපාරය

පසුගිය දශකය තුල දී සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම, සේවා නියුක්තිය, ආදයම් උත්පාදනය සහ ප්‍රාදේශීය සංවර්ධනයට අදළ වූ වැදගත් සාධකයක් ලෙස ඉස්මතු වූ බව දක්නට ඇත.

1980 දී ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාව 3,21,780 ක් වූ අතර මෙය එම වර්ෂය සඳහා ඉලක්කය වූ 2,98,000 සියයට 8 කින් ඉක්මවීමකි; තව ද, එය පසුගිය අවුරුද්දේ පැවති මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාවට වඩා සියයට 29 ක වැඩි වීමකි. එමෙන්ම, මෙම අවුරුද්දේ වූ පැමිණීම් සංඛ්‍යාවේ වර්ධනය පසුගිය දශකයේ පැවති සාමාන්‍ය වර්ධන වේගය වූ සියයට 22.5 ටද වඩා ඉහළ මට්ටමක් පිළිබිඹු කළේය. එසේ වුවද, 1980 දී වාර්තා වූ සංචාරකයින් පැමිණීමේ වර්ධන වේගය 1979 වර්ෂයේ වාර්තා වූ වර්ධන වේගයට වඩා අඩු බව පෙන්වා දිය යුතුය. සංක්‍රාමික මඟින් හැර, නැවගත මඟින් සහ පැය 24 ට වඩා අඩු තාවකාලික කාලයක් රට තුළ රැඳෙන, සංචාරකයන් 8,636 ක්ද 1980 දී මෙරටට පැමිණියහ. මෙය, මෙබඳු පැමිණීම්වල මෑතකදී දක්නට ලැබුණ අඩුවීමේ ප්‍රවනතාවයට ප්‍රතිවිරුද්ධ ලක්ෂණයකි.

කෙසේ වුවද, සංචාරකයින් රට තුළට පැමිණීමේ සංඛ්‍යාව, රටක සංචාරක ව්‍යාපාරයේ ව්‍යාප්තිය දක්වෙන පූර්ණ දර්ශකයක් සේ ගත නොහැකිය. මන්දයත්, සංචාරකයින් රට තුළ ගත කරන දින ගණන සංචාරකයින්ගේ ප්‍රමාණය මැනීමේ වඩා සාර්ථක මිනුම් දණ්ඩක් බැවිනි. 1980 වර්ෂයේ සංචාරකයින් මෙරට ගත කළ දින ගණන සියයට 27 ක වාර්ෂික වර්ධන වේගයක් දක්වමින් දශ ලක්ෂ 3.5 ක් බවට පත්විය. එහෙත්, සංචාරකයන් රට තුළ ගත කළ දින ගණන වැඩිවීමේ වේගය, සංචාරකයින් මෙරටට පැමිණීම වැඩි වීමේ වේගයට වඩා අඩු වූ බව පෙනේ. සංචාරකයකු රට තුළගත කරන සාමාන්‍ය දින ගණන 1975 දී 9.8 සිට 1979 දී දින 11.1 දක්වා වැඩි වුවත්, 1980 දී ඉතා සුළු වශයෙන් අඩු වීමක් පෙන්නුම් කරමින් එය දින 11 ක් විය.

1980 මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 67 ක්ම, මෙතෙක් ප්‍රධාන වෙළෙඳ පොළ වූ බටහිර යුරෝපයෙන් විය. පසුගිය අවුරුද්ද හා සැසඳීමේදී බටහිර යුරෝපීය වෙළෙඳ පොළේ සාපේක්ෂ තත්ත්වය සියයට 2 කින් වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. 1979 මෙන්ම 1980 දීද මුළු පැමිණීම්වලින් සියයට 22 ක් වූයේ වැදගත්කම් අනුව දෙවන තැන ගත් ආසියානු වෙළෙඳ පොළෙනි. පසුගිය අවුරුද්ද හා සැසඳීමේදී සුළු අඩුවීමක් පෙන්නුම් කරමින් මුළු පැමිණීම් වලින් සියයට 5 ක් උතුරු ඇමෙරිකානු වෙළෙඳ පොළෙන් විය.

නවාතැන්, ආහාරපාන, ගමනා ගමන, නානාවිධ භාණ්ඩ මිළට ගැනීම සහ විනෝදාත්මක කටයුතු සඳහා සංචාරකයින් වැය කරන මුදල් සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම්වලට ඇතුළත් වේ. 1980 සංචාරක ව්‍යාපාරයෙන් ඉපැයූ දළ ආදයම රුපියල් දශ ලක්ෂ 1,600 ක් ලෙස ඇස්තමේන්තු කෙරී ඇත. මෙය පසුගිය අවුරුද්දේ ඉපැයූ ආදයම සියයට 33 කින් ඉක්මවීමක් පෙන්නුම් කරයි. විංශ්ෂ හැර ගැණුම් අයිතීන් සහ ඇමෙරිකානු ඩොලර්වලින් සඳහන් කරහොත්, දළ ඉපැයීම් පිළිවෙලින් දශ ලක්ෂ 74.4 ක් හා දශ ලක්ෂ 97 කට සමාන වූ අතර එයින් පිළිවෙලින් සියයට 26 ක හා 27 ක වාර්ෂික වර්ධන වේගයන් දිස්විය.